**ආරක්ෂක අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකා නාවික හමුදාව**

# ප්‍රසම්පාදන දැන්වීමයි

## ශ්‍රී ලංකා නාවික හමුදාවෙහි නෞකා/කදවුරු සඳහා අමු/වියළි ආහාර අයිතම සැපයුම් කිරීමට අදාලව ප්‍රසම්පාදන සිදු කිරීම - 2020 වර්ෂය

*කොන්ත්‍රාත් අංකය* -SLN/VICT/01/2020

1. ශ්‍රී ලංකා නාවික හමුදාව වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ආහාර කාණ්ඩයන්ට හා සැපයුම් ස්ථානයන්ට අදාලව අමු හා වියළි ආහාර අයිතමයන් මිලදී ගැනීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ආයතන, නිෂ්පාදකයින්, සමාගම් සහ සීමිත වගකීම් සහිත සමාගම්, අනෙකුත් වෙළඳ ආයතන වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. කොන්ත්‍රාත් කාලය 2020 ජනවාරි 01 වන දින සිට 2020 දෙසැම්බර් 31 වන දින දක්වා වේ.

1.1 අමු ආහාර කාණ්ඩය

| සැපයුම් ස්ථානය | ආහාර කාණ්ඩය |
|---|---|
| (අ) කාණ්ඩය - නාවික හමුදා සැපයුම් ස්ථාන<br>1.1.1 කොළඹ දකුණ<br>1.1.2 කොළඹ උතුර<br>1.1.3 මහනුවර<br>1.1.4 ගාල්ල<br>1.1.5 තංගල්ල<br>1.1.6 පානම<br>1.1.7 පූනෑව<br>1.1.8 මන්නාරම<br>1.1.9 පුත්තලම<br>1.1.10 මුල්ලිකුලම්<br>1.111 මහව<br>1.1.12 කන්කසන්තුරය<br>1.1.13 කයිට්ස්<br>1.1.14 ත්‍රිකුණාමලය<br>1.1.15 මුලතිව්<br>1.1.16 වාකරේ<br>1.1.17 කින්නියා<br>1.1.18 තිරියාය | අමු ආහාර කාණ්ඩයන්<br><br>1) එළවළු සහ පළතුරු /බිත්තර සහ ලෙලි රහිත පොල්<br>2) ශීත කළ ආහාර<br>3) මස් වර්ග<br>4) කුකුල් මස්<br>5) අලුත් මාළු වර්ග<br>6) කිරි නිෂ්පාදන/අයිස් ක්‍රීම්<br>7) බේකරි අයිතම<br>8) පිසින ලද දේශීය උදෑසන හා රාත්‍රී ආහාර |

1.2. වියළි ආහාර කාණ්ඩය

| සැපයුම් ස්ථානය | ආහාර කාණ්ඩය |
|---|---|
| (ආ) කාණ්ඩය - නාවික හමුදා සැපයුම් ස්ථාන<br><br>1.2.1 කොළඹ දකුණ<br>1.2.2 කොළඹ උතුර<br>1.2.3 මහනුවර<br>1.2.4 ත්‍රිකුණාමලය<br>1.2.5 මුලතිව්<br>1.2.6 වාකරේ<br>1.2.7 කන්කසන්තුරය<br>1.2.8 පුත්තලම<br>1.2.9 මුල්ලිකුලම්<br>1.2.10 පූනෑව<br>1.2.11 ගාල්ල<br>1.2.12 පානම<br>1.2.13 තංගල්ල | වියළි ආහාර කාණ්ඩයන්<br><br>1) සහල්<br>2) ධාන්‍ය වර්ග<br>3) සීනි<br>4) මිරිස් සහ කුළුබඩු වර්ග<br>5) වියළි කරවල<br>6) ආහාර පිසින තෙල්<br>7) පැස්ටා<br>8) කිරි පිටි වර්ග<br>9) බිස්කට් සහ රසකැවිලි වර්ග<br>10) අධිපෝෂ්‍යදායක ආහාර<br>11) ටින් කළ ආහාර<br>12) බේකරි නිෂ්පාදන අමු ද්‍රව්‍ය<br>13) කෝඩියල්/ජෑම්/චට්නි/සෝස් වර්ග<br>14) වෙනත් ආහාර වර්ග<br>15) බෝතල් කළ පානීය ජලය<br>16) කැලෑ සලාක මලු |

එක් එක් ආහාර කාණ්ඩයෙහි ආහාර අයිතමයන්ට අදාල පිරිවිතරයන් සහ අනෙකුත් විස්තර ලංසු ලේඛණය සමග ලබා දෙනු ලැබේ.

සැපයුම් කරනු ලබන සියලුම ආහාර අයිතම නිසි ප්‍රමිතියෙන් යුතුව මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු විය යුතුය. නියමිත තත්ව ප්‍රමිතීන් ලංසු ලේඛණයෙහි සහ එහි ඇමුණුම්හි දක්වා ඇති අතර, ආහාර සැපයුම් කිරීම 1980 හි අංක 26 දරණ ආහාර පනත අනුව සිදු කල යුතුය.

## 1.3 එක් එක් කඳවුරු/සැපයුම් ස්ථාන සහ ආහාර කාණ්ඩයන් සඳහා ලංසු ඉදිරිපත් කිරීම

1.3.1 එක් එක් **කඳවුරු/**සැපයුම් ස්ථාන සහ එක් එක් ආහාර කාණ්ඩයන් පදනම් කරගෙන ආදාල එක් එක් **කඳවුරු** ස්ථානයන් සඳහා වෙන වෙනම ලංසු ඉදිරිපත් කල යුතුය. සෑම ලංසුකරුවකු විසින්ම අදාල **කඳවුරු/**සැපයුම් ස්ථානයට සැපයුම් කිරීමට බලාපොරොත්තු වන ආහාර කාණ්ඩයෙහි සියලුම ආහාර අයිතමයන්ට ලංසු තැබිය යුතුය. කිසියම් ලංසුකරුවකු ආහාර කාණ්ඩයක සියලුම ආහාර අයිතමයන්ට ලංසු නොතබන අවස්ථා වලදී එම ලංසුව ප්‍රතිචාර නොදැක්වූ ලංසුවක් සේ සලකණු ලැබේ.

සෑම ලංසුකරුවකුහටම පහත දක්වා ඇති ආකාරයට වෙන් වෙන් වශයෙන් ආහාර කාණ්ඩ එකකට හෝ වැඩි ගණනකට සහ සැපයුම් ස්ථානයන් එකකට හෝ වැඩි ගණනකට ලංසු තැබිය හැක. ඒ අනුව ලංසුකරුගේ හැකියාව හා සුදුසුකම් අනුව ලංසු ඇගයීම සිදු කෙරේ.

### 1.3.2 'අ' කාණ්ඩය - එක් එක් සැපයුම් ස්ථාන සඳහා අමු ආහාර අයිතමයන් සැපයුම් කිරීම.

මෙම කාණ්ඩයෙහි ලංසු 144ක් වන අතර, (සැපයුම් ස්ථාන 18 x ආහාර කාණ්ඩ 8 = ලංසු 144) වෙනම මිලදී ගැනීමේ, මිල ඇගයීමේ සහ තෝරා ගැනීමේ ක්‍රියාවලියක් වශයෙන් වෙන් වෙන්ව සලකණු ලැබේ.

**1.3.3 'ආ' කාණ්ඩය - එක් එක් සැපයුම් ස්ථාන සඳහා වියළි ආහාර අයිතමයන් සැපයුම් කිරීම.**

මෙම කාණ්ඩයෙහි ලංසු 208ක් වන අතර (සැපයුම් ස්ථාන 13 x ආහාර කාණ්ඩ 16 = ලංසු 208) වෙනම මිලදී ගැනීමේ, මිල ඇගයීමේ සහ තෝරා ගැනීමේ ක්‍රියාවලියක් වශයෙන් වෙන් වෙන්ව සලකණු ලැබේ.

02 තෝරාගනු ලබන සැපයුම්කරුවන් විසින් කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව එක් එක් සැපයුම් ස්ථාන/ ආයතන/ නෞකා සහ අනුකණ්ඩ වෙත ආහාර ප්‍රවාහනය සම්බන්ධයෙන් වගකිව යුතුය. එක් එක් සැපයුම් ස්ථාන /ආයතන /නෞකා සහ අනුබණ්ඩ පිළිබඳව විස්තර ලංසු ලේඛණයෙහි ඇතුලත් කර ඇත.

03 සැපයුම්කරුවන් තෝරා පත්කර ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි ඡේද 3.2 ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු ක්‍රමය හරහා සිදු කරණු ලැබේ. විදේශීය සැපයුම්කරුවන් හට ලංසු ඉදිරිපත් කළ නොහැක.

04 ලංසු තැබීම සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරු පුවත් පත් දැන්වීම් පලකරන දිනය වන විට ව්‍යාපාර ලියාපදිංචිය සමග ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ආයතනයක්, නිෂ්පාදකයකු, සමාගමක් සහ සීමිත වගකීම් සහිත සමාගමක්, අනෙකුත් වෙළඳ ආයතනයක් විය යුතුය. ලංසුකරු අසාධු ලේඛණගත ලංසු කරුවෙකු නොවිය යුතුය.

05 පහත සඳහන් සුදුසුකම් ලංසු ඇගයීමේදී සලකා බැලෙන අවම සුදුසුකම් වන අතර, අදාල සුදුසුකම් සනාථ කිරීම කල හැකි ලේඛණයන්ද ලංසුව සමග ඉදිරිපත් කල යුතුය. එම සුදුසුකම් සපුරාලන ලංසු මූලික ලංසු ඇගයීම් ක්‍රියාවලියේදී සාරාණුකූලව ප්‍රතිචාර දැක්වූ ලංසුවක් වශයෙන් තෝරා ගනු ලැබේ. නමුත් කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ තීරණය ලංසු ලේඛණයෙහි දක්වා ඇති පරිදි පසු ලංසු ඇගයීමේ ක්‍රියාවලියෙන් පසුව තීරණය කරනු ලැබේ.

05.1 අවසාන වර්ෂ 02 ක සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම රුපියල් **මිලියන 10 ක්** බව මූල්‍ය ප්‍රකාශයක්(විගණනය කරන ලද හෝ නොකරන ලද 2017/2018 මූල්‍ය ප්‍රකාශණ) මගින් සනාථ කල යුතුය. තවද, විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කරන ලංසු කරුවන්, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශණ පසු පහසුකම් සත්‍යාපනය කිරීමේ අදියරේදී ඉදිරිපත් කල යුතුය.

05.2 අවම වශයෙන් රුපියල් **මිලියන 05 ක** ද්‍රවශීල (අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් , කෙටිකාලීන ආයෝජන සහ ලැබිය යුතු කෙටිකාලීන ණය) වත්කමක් ඇති බව අදාල මූල්‍ය ප්‍රකාශණ (විගණනය කරන ලද හෝ නොකරන ලද 2017/2018 මූල්‍ය ප්‍රකාශණ) මගින් තහවුරු කල යුතුය. තවද, විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කරන ලංසු කරුවන්, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශණ පසු පහසුකම් සත්‍යාපනය කිරීමේ අදියරේදී ඉදිරිපත් කල යුතුය.

05.3 ලංසු කරුගේ බැංකුව හෝ මූල්‍ය ආයතන විසින් සපයනු ලබන අවම ණය සීමාව රුපියල් **මිලියන 05** විය යුතුයි. (මෙම ටෙන්ඩරය සඳහා පමණි.)

05.4 ලංසුකරු සඳහා අවසන් වර්ෂ 02 ක් (2017,2018) තුල රාජ්‍ය ආයතන වෙත හෝ වෙනත් ආයතනයන් වෙත ආහාර සැපයීම සම්බන්ධයෙන් තහවුරු කල හැකි පලපුරුද්දක් තිබිය යුතුය.

05. 5 අමු ආහාර අයිතමයන් සැපයීම සඳහා, ලංසුකරු විසින් ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම්, ශීත කාමර/අධි ශීතකරණ සහ ශීත ට්‍රක් රථ පහසුකම් (එම පහසුකම්හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට/කුලියට ලබා ගෙන තිබිය හැක.) සපුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සඳහන් කල යුතුය. ඒ සම්බන්ධ අමතර තොරතුරු ලංසු ලේඛණය සමග ලබාදෙනු ලැබේ.

05.6 වියළි ආහාර අයිතමයන් සැපයීම සඳහා, ලංසුකරු විසින් ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම් (එම පහසුකම් හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට/කුලියට ලබා ගෙන තිබිය හැක.) සපුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සඳහන් කල යුතුය. ඒ සම්බන්ධ අමතර තොරතුරු ලංසු ලේඛණය සමග ලබාදෙනු ලැබේ.

06. ලංසු ලේඛණ නිකුත් කිරීම, ලංසු ඉදිරිපත් කිරීම සහ ලංසු විවෘත කිරීම අදාල දිනය සහ වේලාව පහත පරිදි වේ.

**ලංසු ලේඛන නිකුත් කිරීම් ආරම්භ කරනු ලබන දිනය : 2019.08.02**

**ලංසු ලේඛන නිකුත් කරනු ලබන අවසාන දිනය සහ වේලාව :**2019.08.22 වන දින ප.ව 4.00 දක්වා

**ලංසු ඉදිරිපත් කල යුතු අවසාන දිනය සහ වේලාව :** 2019.08.23 වන දින පෙ.ව 9.00 දක්වා

**ලංසු විවෘත කරනු ලබන අවසාන දිනය සහ වේලාව :**

අමු ආහාර - 2019.08.23 වන දින පෙ.ව 09.00 සිට

වියළි ආහාර - 2019.08.23 වන දින පෙ.ව 09.00 සිට

07. පූර්ව ලංසු රැස්වීම 2019.08.07 වන දින පෙව 10.00 පැයට ප්‍රධාන සම්මන්ත්‍රණ ශාලාව, 03 වන මහල, ආරක්‍ෂක අමාත්‍යාංශය, බාලදක්ෂ මාවත, කොළඹ 03 ලිපිනයෙහි පැවැත්වේ.

08. පහත ඡේද 16 හි සඳහන් ලිපිනයෙන් ලංසුකරුගේ ලිඛිත ඉල්ලීම පරිදි අධ්‍යක්‍ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්) මගින් ලංසුකරුවන් හට නැවත නොගෙවනු ලබන ගාස්තුව ගෙවීමෙන් පසු ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් ලංසු ලේඛනයන් මිලදී ගත හැක. ආපසු නොගෙවනු ලබන වටිනාකම් මුදල් අමාත්‍යාංශය මගින් තීරණය කර ඇති චක්‍රලේඛන 2016 ජුනි මස 17 වන දිනැති 06/2016 ප්‍රකාරව සිදු කරනු ලැබේ. (එක් එක් ලංසුවට අදාලව ආපසු නොගෙවනු ලබන වටිනාකම් පිළිබඳ විස්තර පහත ඡේද 16 හි සඳහන් අධ්‍යක්‍ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්), ශ්‍රී ලංකා නාවික හමුදාව යන ලිපිනයෙන් ලබා ගත හැක.)

09. ලංසු ඉදිරිපත් කළ හැකි වන්නේ අධ්‍යක්‍ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්) කාර්යාලය මගින් ලබා දෙනු ලබන ලංසු ලේඛනයෙහි ඇමුණුම් අනුව පමණක් වේ. සියලුම මුද්‍රා තබන ලද ලංසු අනුපිටපත් සහිතව ලියාපදිංචි තැපැල මගින් එවීම හෝ ඡේද අංක 16 හි සඳහන් ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය තුලට ඉහත ඡේද 06 හි සඳහන් දිනය සහ වේලාවට ප්‍රථම බහාලිය යුතුය.

10. ලංසු විවෘත කිරීමට නියමිත වේලාවටම ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම සඳහා ලංසුකරුවන් හෝ බලයලත් නියෝජිතයන් හට සහභාගී විය හැක.

11. ඉදිරිපත් කරන ලංසුවෙහි වලංගු කාලය 2020 මාර්තු මස 31 වන දින දක්වා විය යුතුය.

12. ඉදිරිපත් කරන ලංසුව සමග 2020 අප්‍රේල් 30 වන දින දක්වා වලංගු වන පරිදි ලංසු සුරක්ෂණ ඇපකරයක් ලේකම් ආරක්‍ෂක අමාත්‍යාංශය නමට ඉදිරිපත් කළ යුතුය. එම ලංසු සුරක්ෂණ ඇපකරය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද කොන්දේසි විරහිතව මුදල් බවට පරිවර්තනය කළ හැකි ලංසු සුරක්ෂණ ඇපකරයෙහි මුල් පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය. (අදාල බැංකුවේ ලිපි ශීර්ෂය සහිතව) ලංසු සුරක්ෂණ ඇපකරයෙහි වටිනාකම මිල දී ගැනීමේ මාර්ගෝපදේශ සංග්‍රහය 2006 ප්‍රකාරව ලංසු ලේඛනයෙහි සඳහන් කර ඇත.

13. ලංසුකරුවන් විසින් ලංසු ලේඛනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය වූ විට නිෂ්පාදන සහතිකයන් ඉදිරිපත් කළ යුතු වේ.

14. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ මගපෙන්වීම මත ආරක්ෂක අමාත්‍යාංශයෙහි ආහාර මිලදී ගැනීම් හා ආවේක්ෂණ ඒකකයෙහි ඉල්ලීම පරිදි ලංසුකරුවන් විසින් ලංසු ලේඛනයෙහි දක්වා ඇති ආහාර අයිතමයන් සඳහා නියැදියන් (sample) හෝ අදාල අයිතමයන් සඳහා බලයලත් ආයතනයකින් නිකුත් කරන ලද සහතික ඉදිරිපත් කල යුතුය. නියමිත කාල සීමාව තුල නියැදියන් ලබා නොදෙන ලංසුකරුවන්ගේ ලංසු ඉදිරියට ලංසු පරීක්ෂාවට යොදා නොගන්නා අතර, එම ලංසුව ප්‍රතිචාර නොදැක්වූ ලංසුවක් වශයෙන් සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

15. උනන්දුවක් දක්වනු ලබන සුදුසුකම් ලත් ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු නාවික හමුදාවෙහි අධ්‍යක්ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්) කාර්යාලය වෙතින් ලබාගත හැකි අතර, ලංසු ලේඛනයන්ද නොමිලේ පහත සඳහන් ඡේද 16 හි දක්වා ඇති ලිපිනයෙන් 2019.08.02 වන දින සිට 2019.08.22 වන දින දක්වා සතියේ වැඩ කරන දින වල පෙ.ව 09.00 සිට ප.ව 03.00 දක්වා වේලාව තුල පරීක්ෂා කල හැක.

16. ඉහත සඳහන් කළ ලිපිනය

| | | |
|---|---|---|
| අවධානය | : | අධ්‍යක්ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්) |
| ලිපිනය | : | නාවික හමුදාධිපති<br>නාවික හමුදා මූලස්ථානය<br>තැ.පෙ. 593<br>කොළඹ 01. |
| දුරකථන | : | 0117190000 දිගුව 12351, 0117192351 |
| ෆැක්ස් | : | 0112424577 |
| ඊමේල් | : | nhqdnvc@navy.lk |

සභාපති,
අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
(2020 වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදාව සඳහා අමු සහ වියළි ආහාර අයිතමයන් ප්‍රසම්පාදනය)
ආරක්ෂක අමාත්‍යාංශය
2019.07.26